


**මෙම සමාගමේ කටුනායක හා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොලෙහි පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# කාර්මික ශිල්පි (ඩීසල් වැද්දුම්) 11වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** සහකාර ඉංජිනේරු හා තාක්ෂණ නිළධාරීන් යටතේ සියළු විදුලි උත්පාදක යන්ත්‍ර හා ඒ හා සම්බන්ධ අදාල යාන්ත්‍රික උපකරණවල සේවා හා නඩත්තු කටයුතු කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 සියළු විදුලි උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්දිත පද්ධති හා අදාල යාන්ත්‍රික උපකරණ ආශ්‍රිත හදිසි ක්‍රියා විරහිත වීම් හා, බිඳ වැටීම් යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කිරීම.

11 අවශ්‍ය වු විටක ඉහත ක්ෂේත්‍ර වපසරියේ සවි කිරීම් හෝ නවීකරණ කටයුතු කිරීම.

111 කටුනායක, මත්තල, සහ පිදුරුතලාගල පිහිටුවා ඇති විදුලි උත්පාදක යන්ත්‍ර වල සේවා කටයුතු හා අළුත් වැඩියා කටයුතු සිදු කිරීම.

1V විදුලි උත්පාදක යන්ත්‍ර, ඒ හා සම්බන්ධ අදාළ යාන්ත්‍රික උපකරණ වලට අදාලව ක්‍රියාකරවීම් හා නඩත්තු කටයුතු සඳහා දත්ත වාර්තා පවත්වා ගෙන යාම.

V ඉහල නිළධාරින් විසින් සපයා දෙනු ලබන ගුවන් තොටුපොල පරිශ්‍රය තුල ඇති විදුලි උත්පාදක යන්ත්‍ර ක්‍රියාකාරීත්වය හා සම්බන්ධ කාර්යය සටහන් යාවත්කාලීන කරමින් දෛනික පරීක්ෂාවේ යෙදවීම.

VI දත්ත වාර්තා රැස් කිරීමෙන් හා නිරීක්ෂණ කටයුතු තුලින් ඉහල නිළධාරීන්ගේ පරීක්ෂණ කටයුතු සඳහා සහාය වීම.

VII විදුලි උත්පාදක යන්ත්‍ර උපකරණ හා ඒ අවට පරිසරය සතුටුදායක අයුරින් පවත්වා ගෙන යාම.

VIII ගුවන් තොටුපොල නඩත්තු කටයුතු ක්‍රියාවලිය හා සම්බන්ධ ගැටළු අවස්ථාවන්හිදී සක්‍රිය ලෙස ඒ සඳහා දායක වීම.

01. **සුදුසුකම් :** (අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් ඩීසල් වැද්දුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය. නැතහොත් දැවුරුද්දකට නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය සහතකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිය යුතුය.

සහ

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාලසිමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සටහන :** ඉහත අංක 1 හි (අ) හා (ආ) හි සඳහන් සුදුසුකම් නොමැති අවස්ථාවේදී කාර්මික ශිල්පී(ඩීසල් වැද්දුම්) යන තනතුර සඳහා පමණක් අදාළ ක්ෂේත්‍රයේ NVQ level 4 වෘත්තීය සහතිකයක් සමග පිළිගත් ආයතනයක වසර හයක (06) සේවා පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් සළකා බැලේ.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන් හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**පොදු කරුණු :-**

**ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.**

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව සකසා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයක් පහත සඳහන් ලිපිනයට අදාළ සහතිකපත් වල ඡායා පිටපත්ද සමග **ලියාපදිංචි තැපෑලෙන්** පමණක් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **අයදුම්කරන තනතුර** සඳහන් කළ යුතුවේ.

**පාඨමාලා සහතික , සේවා සහතික හා** අනෙකුත් සහතික **වල ඡායා පිටපත් හා ඉහත සඳහන් ආකාරයෙන් අයදුම්පත් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**සියළුම අයදුම්පත් පහත සඳහන් ලිපිනයට 2020 මාර්තු මස 16 වන දිනට පෙර ලැබීමට සලස්වන්න.**

**සභාපති**

**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්**

**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**

**කටුනායක**